ඔබව දැනුවත් කිරීම අපගේ යුතුකමකි
WARNA LEGAL විසින් ඔබ වෙනුවෙන් පිළෙන
සමාජ සත්කාර උපදෙස් පිටුවට ඔබගේ ප්‍රශ්න යොමු කරන්න
+61 3 9792 9977 info@warnalegal.com

WARNA LEGAL
Justice for all



**මම තාවකාලික වීසා දරන්නෙක් වෙමි. (Bridging Visa C ) මට රැකියා කිරීමේ පහසුව මෙම වීසාව මගින් සලසා නැති හෙයින් ඉතා අසීරුවෙන් ජීවත් වෙමි. මාගේ රැකියා පහසුව ලබා ගත හැකිද?**

1. **මා අනවසර සංක්‍රමණිකයෙකු ලෙස බෝට්ටුවෙන් ඕස්ට්‍රේලියාවට වර්ෂ 2012 දී පැමිණියෙමි. මාගේ තාවකාලික රැකවරණ වීසාව ප්‍රතික්ෂේප කර ඇති බැවින්, ප්‍රාන්ත අධිකරණයේ නඩු පවරා එයද ප්‍රතික්ෂේප වී ඇත. මා දැන් කළ යුත්තේ කුමක්ද?**

**නිරෝෂන් - Doveton**

ඔබගේ ප්‍රාන්ත අධිකරණ (Federal Court) කටයුතු අවසන් වුවත් ඔබට සාධාරණ විසඳුමක් ලැබී නොමැති බවට ඔබ විශ්වාස කරන්නේ නම් ඕස්ට්‍රේලියානු මහාධිකරණයේ (High Court) නඩුව ගොනු කළ හැකිය. ඊට අමතරව ආගමන විගමන ඇමතිවරයා වෙත ඔබගේ නවතම සහ විශේෂිත වෙනස්කම් තත්ත්වය සලකා බලන ලෙස ආයාචනයක් (Ministerial Intervention Request) ඉදිරිපත් කළ හැකිය

2. **මාගේ වෙන්වූ බිරිඳ ලංකාවේ වෙසෙන අතර ඇය ශ්‍රී ලංකාවේ අධිකරණයේ දික්කසාද නඩුවක් ගොනු කර ඇති බව සැලවේ. මෙය මා හරි ආකාරව දැන ගනු ලබන්නේ සහ උත්තර බඳින්නේ කෙසේද?**

**නිමල් - Brisbane**

ඔබගේ වෙන්වූ බිරිඳ අදාල දික්කසාද ලියවිලි කන්සියුලර් කාර්යාලය හරහා ඔබ වෙත ලැබීමට සලස්වනු ඇත. ඉදිරි පියවරක් ලෙස ඔබ මෙම නඩුවේ යම් විස්තරයක් දන්නේ නම් ශ්‍රී ලංකාවේ ඔබගේ නීතිඥවරයෙකු ඔබ වෙනුවෙන් පත් කර අවශ්‍ය ලිපි ලේඛන ලබා ගැනීම සහ උත්තර බැඳීම සඳහා ඔබට කටයුතු කළ හැකිය.

3. **මම තාවකාලික වීසා දරන්නෙක් වෙමි. (Bridging Visa C ) මට රැකියා කිරීමේ පහසුව මෙම වීසාව මගින් සලසා නැති හෙයින් ඉතා අසීරුවෙන් ජීවත් වෙමි. මාගේ රැකියා පහසුව ලබා ගත හැකිද?**

**නිම්මි - Frankston, Victoria**

Bridging visa C නිකුත් කරනු ලබන්නේ රැකියා පහසුව ඉවත් කරමින්මය. ("No Work" - 8101) කෙසේ නමුත් ඔබට ඔබගේ මූලික අවශ්‍යතා එනම් නවාතැන් පහසුකම්, ආහාරපාන, ඇඳුම් පැළඳුම්, බෙහෙත් ආදිය සඳහා වියදම් කිරීමේ ගැටළු ඇත්නම් ඔබගේ මෙම වීසා කොන්දේසි ඉවත් කරන ලෙස ඉල්ලා අයදුම්පතක් ඉදිරිපත් කළ හැකිය. අයදුම සහ ඒ සඳහා ඉදිරිපත් කරන උපකාරක සාක්ෂි සලකා බැලීමෙන් පසුව, ඔබට රැකියා පහසුව ලබා දීමට ආගමන විගමන දෙපාර්තමේන්තුව කටයුතු කරයි.

4. **මාගේ ගොඩනැගිල්ල කුලියට ගත් අය මා හට මාස 4කින් කුලී ගෙවා නැත. වරිපනම් සහ අදාල ජල සම්පාදන ගාස්තුද මාගේ අතින් ගෙවා ඇත්තෙමි. මා කුලී ලබා ගැනීම හෝ කුලී කරුවන් ඉවත් කිරීම සඳහා කුමක් කළ යුතුද?**

**හුසේන් - Hampton Park**

ඔබට කුලී හෝ අනෙකුත් ගාස්තු, කුලී ගිවිසුමේ සඳහන් කොන්දේසි අනුව ලැබී නොමැති නම්, එම හිඟ මුදල ඉල්ලා කුලී කරුවන් වෙත එන්තරවාසි යැවිය හැකිය. ඔවුන් අයුතු ලෙස ඔබ ගොඩනැගිල්ලේ තවදුරටත් රැඳී සිටින්නේ නම්, ඔබට ඔවුන් ඉවත් කිරීම සඳහා දැන්වීම් (Quite notice) යවා ඔවුන් ගොඩනැගිල්ලෙන් ඉවත් කළ හැකිය.

5. **මා මිලට ගත් ඉඩම් කට්ටිය තවම ගැනීමේ කටයුතු (Settlement) අවසන්ව නැත. පසුගිය දිනෙක මා ඉඩම් කට්ටිය නැරඹීම සඳහා ගිය විට දුටුවේ අල්ලපු ඉඩමේ ඉදිකරන නිවස සඳහා ගෙනෙන අමුද්‍රව්‍ය මාගේ ඉඩමේ තැන්පත් කර ඇති බවයි. මෙය ඉවත් කර ගැනීම සඳහා මා කාට පැවසිය යුතුද?**

**නිලාන් - Wallert**

ඔබගේ ඉඩම් මිලට ගැනීමේ කටයුතු සිදු කරන නීතිඥ මගින් විකිණීම සිදු කරන නීතිඥ වෙත දැනුම් දී, මෙම අමුද්‍රව්‍ය ඉවත් කිරීම සිදු කරගත හැකිය. මේ අතරම ඔබගේ ඉඩම විකිණීම සිදු කරන ඒජන්ත (Estate Agent) මේ සම්බන්ධයෙන් දැනුවත් කර අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලීම් කිරීමෙන්ද මෙම අදාල නොවන අමුද්‍රව්‍ය තොග ඉවත් කිරීමට කටයුතු කළ හැකියි.

WARNALEGAL
Justice for all
නීති උපකාර | சட்ட சேவைகள் |
Need Legal Help? Call us Now



Madhu
Warnakulasuriya LL.B
Solicitor and Barrister
Registered Migration Agent
(MARN 1068979)
Attorney at Law in Sri Lanka

- FAMILY LAW
- AUSTRALIAN LEGAL ADVICE
- MIGRATION LAW
- SRI LANKAN LEGAL ADVICE
- CONVEYANCING
- COMMERCIAL & BUSINESS LAW
- LITIGATION
- POWERS OF ATTORNEY & WILLS
- ENGLISH/SINHALESE TRANSLATION & INTERPRETING SERVICE
- SRI LANKAN DEEDS AND COMPANY REGISTRATION SERVICE

03 9792 9977

Sri Lanka:
01 Angampitiya Waikkala Sri Lanka
Hotline – 0776 120 008
031 22 72223 031 22 72223
warnalegal2@gmail.com
warnalegal2

Australia:
1/44 King Street
Dandenong VIC 3175
0432 480 133
+61 3 9792 9977
+61 3 9701 3718
info@warnalegal.com
warnalegal1
www.warnalegal.com